**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය - 2017**

**--------------------------------------------------**

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක එස්ආර්අයි -2217 දරන ණය ගිවිසුමේ 6 උපලේඛනයේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව එවකට උසස් අධ්‍යාපන ,මහාමාර්ග හා ඛණිජ සම්පත් අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ග ජාලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා මාර්ග අංශයේ ආයතන සවිබල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

(i) මාර්ග ආංශික ආයතන වර්ධනය කිරීම.
(ii) ව්‍යාපෘති මාර්ගයන් උසස් කිරීම සහ
(iii) නියමු කාර්ය සාධනය මත පදනම් වූ නඩත්තු ගිවිසුම් සංවර්ධනය කිරීම.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 21,655 කට සමාන එ.ජ.ඩො. මිලියන 208 ක් වූ අතර ඉන් රු. මිලියන 15,275 කට සමාන එ.ජ.ඩො මිලියන 150 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි.පසුව 2008 පෙබරවාරි 15 වන දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීම සඳහා ණය ගිවිසුම 2008 මැයි 27 දිනට අනුව සංශෝධනය කරන ලදී. ඉහත ණය මුදලට අමතරව, අංක 1355 පී දරන තවත් ණය ගිවිසුමක් ශ්‍රී ලංකා රජය විසින් ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සමඟ 2010 ඔක්තෝබර් 04 දින අත්සන් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 880කට සමාන එ.ජ.ඩො මිලියන 8ක් වෙන් කිරීමට ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් එකඟවී තිබුණි.ඇමෙරිකන් ඩොලර් මිලියන 85 කට සමාන රු. මිලියන 9,350 ක් වටිනා අංක 2767 - එස්ආර්අයි දරණ අමතර ගිවිසුමක් ශ්‍රී ලංකා රජය සමඟ ආසියානු සංවර්ධන අරමුදල 2011 ඔක්තෝබර් 04 දින අත්සන් තබන ලදි.2014 වසරේ සිට ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද කටයුතු සඳහා අමතර ණය ගිවිසුම යටතේ මූල්‍යණය කර තිබුණි. මුල් ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය එහි කටයුතු 2006 අප්‍රේල් 07 දින ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම්කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙනත් ව්‍යාපෘතියේ කටයුතු ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදා ගනිමින් අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණු අතර 2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත්, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවධානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබද සතුටුදායක පාලනයක් සහ ව්‍යාපාතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැසඳීමට පත්වන ලෙස සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යව බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති ගැලපීම් වලින් පැන නගින බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගණකාධිකරණ අඩුපාඩු**

2017 දෙසැම්බර් 17 වන දින රඳවා ගැනීමේ මුදලක් ලෙසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු රු. මිලියන 31.91 ක මුදලක් මේ වන තෙක් ගිණුම්වලට ගෙන නොමැති අතර මූල්‍ය ප්‍රකාශන තුල ඒ පිළිබඳ පෙන්නුම් කර නොමැත.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යාමය දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ. ඩො මිලියන | රු. මිලියන | එ.ජ. ඩො මිලියන | රු. මිලියන | එ.ජ. ඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ | 150.00 | 15,275 | - | - | 150.00 | 17,272 |
| ආර්ථික සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල | 8.00 | 880 | - | - | 8.00 | 928 |
| ශ්‍රී ලංකා රජය | 58.00 | 6,380 | - | - | 62.07 | 9,177 |
| | 216.00 | 22,535 | - | - | 220.07 | 27,377 |

**3.2 භෞතික ප්‍රගතිය.**

ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ විෂය පථයට මාර්ග ක්ෂේත්‍රයේ ආයතනයන්ගේ වර්ධනය, කි.මී.283 ක මහා මාර්ගයන්ගේ තත්වය උසස් කිරීම හා පුළුල් කිරීම සහ නඩත්තු කාර්යසාධන මත පදනම් වූ නඩත්තු කොන්ත්‍රාත් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුලත් වේ. ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ව්‍යාපෘති සමාප්ති වාර්තාවට අනුව, පුත්තලම් - අනුරාධපුර මාර්ගය, උඩතැන්න - මහියංගනය, මාර්ගය නුවරඑළිය - බදුල්ල මාර්ගය, හබරණ - කන්තලේ මාර්ගය සහ නුගේගොඩ - හෝමාගම මාර්ගය යන කි.මී 244 ක මහා මාර්ගයන්හි සංවර්ධන සහ පුළුල් කිරිමේ කටයුතු 2016 වසර තුලදී අවසන් කරන ලදී. නමුත් ඒ සදහා වන ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 18,024 වුවත් කොන්ත්‍රාත්කුවට යටතේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ දින ගණන දින 52 සිට දින 450 ක් දක්වා වැඩිවීම හේතුකොටගෙන එකී පිරිවැය රු.මිලියන 20,137 දක්වා වර්ධනය විය.

(ආ) තවද ඉහත ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික් 3ක කි.මී. 300 ක මහාමාර්ගයන් කාර්ය සාධන මාර්ග සංවර්ධන කොන්ත්‍රාත් යටතේ නඩත්තු කිරීමට බලාපොරොත්තු වූ අතර ඒ අතරින් කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ කි.මී. 36 ක දුරක් සහ අවිස්සාවේල්ල - හැටන් - නුවර එළිය මාර්ගයේ කි.මී. 72 ක දුරක් මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉන්ජිනේරු අංශ 3 ක් විසින් කාර්ය සාධන කොන්ත්‍රාතු යටතේ පසුගිය වසරේ අවසාන වන විට කාර්ය සාධන මාර්ග සංවර්ධන කොන්ත්‍රාත් යටතේ නිමකරන ලදී.

(ඇ) 2014 නොවැම්බර් 18 දින මහාමාර්ග ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු නිමවී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදුන් නමුත් පසුව ව්‍යාපෘතියේ විෂය පථය තුල සිදුවූ උග්‍ර වෙනස්කම් හේතුවෙන් ඉදිකිරීම් වැඩකටයුතු සඳහා වන පිරිවැය රු.මිලියන 2506.54 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වෙතත් ඒ සඳහා වන අනුකූලතා සහතිකය 2018 දෙසැම්බර් වන විටත් නිකුත් කර නොතිබුණි.

**3.3 මතභේදාත්මක කරුණු**

මහාමාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුල වූ අභ්‍යතර අලංකරණ කාර්යයන්ට අදාල කොන්ත්‍රාත්තු රු.මිලියන 305.79 ක මුදලකට කොන්ත්‍රාත්කරුවන් 19 ක් වෙත ලබා දී ඇත. ඒ අතරින් කොන්ත්‍රාත්කරුවන් 4 ක් වෙත බෙදුම්කණු තැබිම සහ සිවිලිම්, ලී බඩු , දැව ආශ්‍රිත වැඩ සැපයුම හා සවි කිරීම සහ බිම අලංකරණ වැඩ සඳහා ඇස්තමේන්තු පිරිවැය ලෙස රු.මිලියන 241.60 ක් යටතේ ලබා දී ඇති අතර ඒ සඳහා වැයවන කාලසීමාවද දින 147 සිට දින 154 දක්වා දීර්ග කර තිබුණි. එලෙසම කාලය දිගුවීම නිසා සිදුවූ අලාභයට ප්‍රතිකර්ම ලෙසින් රු.මිලියන 7.3 කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත ලබාදී තිබුණි.

**3.7 ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය අවසන් කිරීම.**

ව්‍යාපෘතියට අදාල ප්‍රධාන මහා මාර්ගයන් සංවර්ධන කිරීම සහ පුළුල් කිරීම් කටයුතු සහ පිළිසකර කිරීමේ වැඩ සහ මහා මාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දීමේ කාර්ය 2016 වන විට අවසාන වුවත් අදාල ක්‍රියාත්මන කරවීමේ ආයතනය විසින් ව්‍යාපෘතියට ඇවර කිරීමට අදාල ලෙජර් ගිණුම් සහ මූල්‍ය වාර්තාවන් සකස් කිරීමට අදාල උපදෙස් නිකුත් කර නොතිබුණි.